# පූර්ව හා අපර බ්‍රාහ්මී ශිලාලේඛනවලින් හෙළිවන පැරණි සිංහල භාෂාව පිළිබඳ විමර්ශනයක්

**ප්‍රනාන්දු ටී.කේ.**[1]

ශ්‍රී ලාංකේය මුල් ම අක්ෂර පද්ධතිය බ්‍රාහ්මී අක්ෂර වේ. මෙම අධ්‍යයනයේ දී පූර්ව හා අපර බ්‍රාහ්මී ශිලා ලිපිවලින් හෙළිවන පැරණි සිංහල භාෂාව පිළිබඳ සාකච්ඡා කෙරේ. මෙම පර්යේෂණයේ අරමුණු වන්නේ පූර්ව හා අපර බ්‍රාහ්මී ශිලා ලිපිවලින් හෙළිවන පැරණි සිංහල භාෂාව පිළිබඳ අධ්‍යයනය කිරීම, සිංහල භාෂාවේ වර්ධනය හඳුනා ගැනීම, හුදු හෙළ භාෂාව අවබෝධ කර ගැනීම, ලංකාවට ම ආවේණික වූ අක්ෂර හා භාෂාව හඳුනා ගැනීම ආදිය යි. මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කරමින් සිදු කරන ලද්දකි. මෙහි දී ප්‍රථමයෙන් ම සෙල්ලිපි විස්තරාර්ථ සඳහන් වන ලිපිපත්, සංස්කරණ කෘති ඇසුරින් පෙළ අධ්‍යයනය කළ අතර, පැරණි සිංහල භාෂාව පිළිබඳ සොයා ගනිමින් දත්ත විශ්ලේෂණය කර ප්‍රතිඵල ඉදිරිපත් කරන ලදී. මිහින්තලා ලිපිය, රාජගිරි ලිපිය, අනයික්කුට්ටි ආදී ලිපි පමණක් නොව ලිපි රාශියක් පැරණි බ්‍රාහ්මී අක්ෂරවලින් කොටවා ඇත. ලංකාවට ම ආවේණික වූ අක්ෂර දක්නට ලැබේ. කේවල අක්ෂර දීර්ඝස්වර හෝ ව්‍යඤ්ජනාශ්‍රිත දීර්ඝස්වර දක්නට ලැබේ. සංයුක්තාක්ෂර හෝ මහා ප්‍රාණාක්ෂර ද විරල වශයෙන් දක්නට ලැබේ. එකල යුගවලට අයත් ලිපිවල පවා එකම වචනයේ විකල්ප රූප දක්නට ලැබේ. මෙහි දී නිගමනය කළ හැකි වන්නේ විනයධර, බහුශ්‍රැත, ව්‍යක්තධර භික්ෂූන් වහන්සේලා සිටි නිසා එකල ලක්වැසි ජනතාව ද විහාරස්ථාන කේන්ද්‍ර කොටගෙන අකුරු ලිවීමට හා කියවීමට උත්සුක වූවා විය හැකි ය. එමෙන් ම ලංකාවට ම අනන්‍ය වූ භාෂා රටාව උපයෝගී කර ගනිමින් ශිලා ලිපි නිර්මාණයට උත්සහ ගත් බැව් ද නිගමනය කළ හැකි වේ. මෙම අධ්‍යයන සිදු කරනු ලැබුවේ "පූර්ව හා අපර බ්‍රාහ්මී ශිලා ලිපිවලින් හෙළිවන පැරණි සිංහල භාෂාව කෙබඳු ද?" යන පර්යේෂණ ගැටලුව කේන්ද්‍ර කොට ගෙන ය. සාහිත්‍යය විමර්ශන පරීක්ෂා කිරීමේ දී පූර්ව හා අපර බ්‍රහ්මී ශිලා ලිපි ඇසුරු කරමින් සිදු කරන ලද පූර්ව අධ්‍යයන හමු වූ අතර එහි දී භාෂා ලක්ෂණ, සමාජීය ලක්ෂණ ආදිය කෙරෙහි අවධානය යොමු වුව ද පැරණි සිංහල භාෂාව පිළිබඳ අධ්‍යයන සීමිත වේ.

**ප්‍රමුඛ පද :** පූර්ව, අපර, ශිලා ලිපි, පැරණි, සිංහල ලිපි

[1]සිංහල අධ්‍යනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. kalyanikf25@gmail.com